# ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ රාජ්‍ය සේවක දැනුවත්භාවය

එච්.එම්.එච්.සී. හේරත්[1] ආර්.ටී.ඒ. සම්පත්ගේ[2]
එන්.එච්.එම්. ප්‍රනාන්දු[3] ජේ.එම්.ඩී.එම්.එච්. දෙව්දුනි[4]
එම්.කේ. නදීකා දමයන්ති[5]

**සංක්ෂේපය**

ආයතන සංග්‍රහය යනු, ගුණාත්මක හා කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාදීමේ අරමුණින් රාජ්‍ය සේවකයා ආරක්ෂා කිරීමටත්, රාජ්‍ය සේවාව තුළ ඇතිවන යම් යම් පීඩාකාරී තත්ත්වයන්ගෙන් සේවා ස්ථානය මුදවා ගැනීමටත් මෙරට රජය විසින් රාජ්‍ය සේවකයාට ලබා දී ඇති ලිඛිත මාර්ගෝපදේශ මාලාවයි. එමෙන්ම ආයතන සංග්‍රහය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට හඳුන්වාදෙනු ලැබුවේ 1985 වර්ෂයේදීය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ආයතන සංග්‍රහයේ 2, 4, 5, 7, 8, 12, 14, 27, 28, 32 පරිච්ඡේදයන්හි එන යුතුකම්, අයිතිවාසිකම්, වරප්‍රසාද හා බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ රාජ්‍ය සේවක දැනුවත්භාවය පිරික්සීමයි. පරිපාලන නීති රීතිවලට අනුව ආයතන සංග්‍රහයෙන් බැහැරව රාජ්‍ය සේවකයන්ට කටයුතු කළ නොහැකි හෙයින් ඒ සම්බන්ධයෙන් වන දැනුවත්භාවය රාජ්‍ය සේවකයකු තුළ පැවතිය යුතුය. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන අංශය හා ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව අධ්‍යාපන කලාපයට අයත් රජයේ පාසලක් තෝරාගත් අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන අංශයේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර, විධායක මට්ටමේ නිලධාරීන් ඇතුලුව කාර්යය මණ්ඩලයේ විසිදෙනෙකු හා තෝරාගත් රජයේ පාසල තුළ ගුරු සේවයෙහි නියුතු අහඹු ලෙස තෝරාගත් ගුරුවරුන් තිස්දෙනෙකු අධ්‍යයන නියැදිය ලෙස තෝරාගන්නා ලදී. මෙම අධ්‍යයනය බෝහෝ දුරට ප්‍රමාණාත්මක දත්ත මත පදනම් වු අතර සරල සංඛ්‍යානමය විධික්‍රම භාවිතාකර දත්ත විශ්ලේෂණය කරන ලදී. නියැදියට ඇතුළත් වු පුරුෂයින් සංඛ්‍යාවට සාපේක්ෂව ස්ත්‍රීන් සංඛ්‍යාව ඉහළ මට්ටමක් ගනු ලැබිණි. නියැදියට අදාළ ප්‍රතිචාරීන්ගෙන් බහුතරය අවුරුදු එකොළහක (11) සේවා කාලයකට අයත් පිරිස වු අතර බඳවා ගැනීමේ පටිපාටිය, මාස් පඩි පිළිබඳව හා පරිපාලන කාර්යය පටිපාටිය, වරප්‍රසාද සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති පිරිස 50% කට වඩා වැඩි විය. ඒ අනුව ගත්කළ රාජ්‍ය සේවකයාට ලබා දී ඇති ලිඛිත මාර්ගෝපදේශ මාලාවක්වන ආයතන සංග්‍රහය පිළිබඳ

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

ඔවුන්ගෙන් දැනුවත් භාවය සහිත ප්‍රමාණය පහළ මට්ටමක පවතින බව මෙමගින් අනාවරණය විය.

**මුඛ්‍ය පද** : ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවය, අධ්‍යාපන අමාත්‍යාංශය, පරිපාලන කාර්ය පටිපාටිය